"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மார்க்கஸ் பெர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 2698409
ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667
ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி / General Telephone 2682868, 2682869, 2682870

මගේ අංකය. / எனது இல. / My No. CSO/ADM/18/38/05-2018
ඔබේ අංකය. / உமது இல. / Your No.
දිනය. / திகதி. / Date. 2018-03-22

**<u>පාලන චක්‍රලේඛ : 02/2018</u>**

ලේකම් ,පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය ,බස්නාහිර පළාත.

ලේකම් ,සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂකසේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශය ,බස්නාහිර පළාත.

පළාත් පාලන කොමසාරිස් ,පළාත් පාලන දෙපාර්තමේන්තුව ,බස්නාහිර පළාත.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ,සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය ,බස්නාහිර පළාත.

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (කොළඹ /ගම්පහ /කළුතර)

බස්නාහිර පළාතේ සියළුම නාගරික කොමසාරිස්වරුන්

බස්නාහිර පළාතේ සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරුන්

බස්නාහිර පළාතේ සියළුම නගර සභා ලේකම්වරුන්

බස්නාහිර පළාතේ සියළුම ප්‍රාදේශීය සභා ලේකම්වරුන්

**<u>පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි මහජන සෞඛ්‍ය සේවාව විධිමත් කිරීම.</u>**

පවතින නීති රීති අනුව මහජන සෞඛ්‍ය සේවා කටයුතු සම්බන්ධයෙන් වගකීම පැවරී ඇත්තේ පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරුන් වෙතය.

02. කෙසේ වුවද ,ඩෙංගු රෝගය වසංගතයක් ලෙස දිවයින පුරා ව්‍යාප්ත වූ පසුගිය සමයේ වාර්තාවූ රෝගීන් හා ජීවිත හානි සංඛ්‍යාවෙන් %50ක් පමණ වාර්තා වූයේ බස්නාහිර පළාතෙනි .එහිදි කසළ කළමනාකරණය , ධූමායනය ,මදුරුවන් බෝවීම වැළැක්වීම සම්බන්ධයෙන් අනෙකුත් කටයුතු ,රෝගීන් සම්බන්ධ වාර්තා සැපයීම් ආදී කාර්යයන් ඉටුකිරීමේදී සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා පළාත් පාලන ආයතනවල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් අතර මෙන්ම ,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරුන් සහ පළාත් පාලන ආයතන ප්‍රධානීන් සමගද අවශ්‍ය පමණට සම්බන්ධීකරණයක් නොතිබුණු අවස්ථාද වාර්තා විය.

03. මෙම හේතු නිසා මහජනතාව වෙත ලබාදිය යුතු සෞඛ්‍ය සේවාවන් නිසි පරිදි ක්‍රියාත්මක නොවීමේ ගැටළුවක් නිර්මාණය වීමට ඉඩ තිබේ .එබැවින් 2018.04.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔබ ආයතනය යටතේ සේවය කරන සියළුම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් පහත සඳහන් පරිදි ක්‍රියාකළ යුතු බව මෙයින් දන්වා සිටින අතර ,ඒ සඳහා විධිවිධාන යොදන ලෙස වැඩිදුරටත් මෙයින් දන්වමි .

1. සෑම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක් සඳහාම රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්ණායකයන්ට අනුකූල වන පරිදි ජන සංඛ්‍යාවකින් යුතු සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයක් පැහැදිලිව වෙන්කර දියයුතු අතර, එම කොට්ඨාශයේ මායිම් තීරණය කිරීමේදී කිසියම් ග්‍රාම නිලධාරී කොට්ඨාශයක් දෙකඩ වන පරිදි මායිම් තීරණය නොකළ යුතුය.

2. එවැනි වූ කොට්ඨාශ නිර්ණය කිරීමේදී අදාළ පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ එකගතාවය මත කොට්ඨාශ මායිම් තීරණය කළයුතුය.

3. ප්‍රමාණවත් නිලධාරී සංඛ්‍යාවක් නොමැතිවීම මත පුරප්පාඩු වන මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශවල වැඩ බැලීම සඳහා යාබද කොට්ඨාශවල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් පත්කිරීමට අදාළ බලධාරීන් ක්‍රියා කළයුතුය.

4. සෑම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුම තම කොට්ඨාශයට අදාළව තම නිල බලයෙන් ඉටුකළ යුතු සියළුම රාජකාරී කටයුතු ඉටුකළ යුතුය .මෙහිදී සාමාන්‍යයෙන් ඔවුන් විසින් ඉටුකළ යුතු කාර්යයන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා වන අත්පොතේ සඳහන් රාජකාරී කරුණු වන අතර ,එයට පරිභාහිරව පළාත් පාලන ආයතන ප්‍රධානියා හා / හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා පවරනු ලබන වෙනත් රාජකාරීද ඇතුළත් වියයුතුය.

5. පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ සේවය කරනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගෙන් ඉටුකරවා ගතයුතු කාර්යයන් අදාළ පළාත් පාලන ආයතන ප්‍රධානියා මගින් ඉටුකරවා ගැනීමට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා කටයුතු කළයුතු අතර ,සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ සේවය කරනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගෙන් ඉටුකරවා ගතයුතු කාර්යයන් අදාළ පළාත් පාලන ආයතන ප්‍රධානියා විසින් එම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා මගින් ඉටුකරවා ගතයුතුය.

6 .කෙසේ වුවද ,සැපයිය යුතු මාසික වාර්තා හා අනෙකුත් වාර්තා සියල්ල කලට වේලාවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා වෙත හෝ පළාත් පාලන ආයතන ප්‍රධානියා වෙත හෝ නියමිත දිනට පෙර ලැබීමට සැලැස්වීම සෑම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුගේම වගකීමකි .

7 .කිසියම් පළාත් පාලන ආයතනයකට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයෙකු අනුයුක්ත කර ඇත්නම්, ඔහු/ඇය එම ප්‍රදේශය භාරව රාජකාරී කටයුතු සිදුකරනු ලබන සියළුම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්

සමඟ නිරන්තරයෙන් සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කළ යුතු අතර ,සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටිනු ලබන ඕනෑම සහයෝගයක් ලබාදීමටද කටයුතු කළ යුතුය.

8 .එසේම කිසියම් පළාත් පාලන ආයතනයක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයෙකු අනුයුක්ත කර නොමැති අවස්ථාවකදී, අධිකරණයක් හෝ වෙනත් අධිකාරියක් ඉදිරියේ එම පළාත් පාලන ආයතනයේ මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් යම් කරුණු දැක්වීමක් සිදුකිරීමට සිදුවුවහොත් ඒ සම්බන්ධව සහ කසළ කළමනාකරණයට අදාළ කරුණු සම්බන්ධයෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අදාළ ප්‍රදේශය භාරව කටයුතු කරනු ලබන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා විසින් කටයුතු කළ යුතුය.

9 .කිසියම් පළාත් පාලන ආයතනයකට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයෙක් අනුයුක්ත කර නොමැති අවස්ථාවකදී එම පළාත් පාලන ආයතන යටතේ සේවය කරනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් අධීක්ෂණ නිලධාරියා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වියයුතු අතර ,පරිපාලන වශයෙන් අධීක්ෂණ නිලධාරියා අදාළ පළාත් පාලන ආයතන ප්‍රධානියා වියයුතුය .ඒ අනුව තම ආයතනයට අනුයුක්තව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙකු නොමැති අවස්ථාවකදී සෑම පළාත් පාලන ආයතන ප්‍රධානියෙකුම තම ආයතනයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සම්බන්ධයෙන් තාක්ෂණික වාර්තා හෝ නිර්දේශ හෝ නිරීක්ෂණ ලබාගත යුත්තේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙතිනි.

10 .ඉහත කී උපදෙස් වලට අනුකූලව කටයුතු කිරීමේදී සෑම පළාත් පාලන ආයතන ප්‍රධානියෙකුම පහත සඳහන් පනත් සම්බන්ධයෙන් අවධානය යොමු කළයුතුය.

මහනගර සභා ආඥා පනතේ 19(4), නගර සභා ආඥා පනතේ 14(4) හා ප්‍රාදේශීය සභා පනතේ 8(2) යන වගන්ති යටතේ සඳහන් විධිවිධානයන් කෙරෙහි අවධානය යොමු කිරීම.

04 .මෙම චක්‍රලේඛය බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය සහ අනුමැතිය මත නිකුත් කරන ලදී.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

<u>පිටපත</u> : 01. ආණ්ඩුකාර ලේකම් (බ.ප.) - කරු.දැ.ගැ.ස.


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | අභ්‍යන්තර විගණන / Director Internal Audit |
|---|---|---|---|---|---|---|
| | Tel: 2693964<br>Fax:2669479<br>dcsadmin@cs.wpc.gov.lk | Tel: 2690058<br>Fax:2693952<br>dcspt@cs.wpc.gov.lk | Tel: 2693978<br>Fax:2679958<br>csfinance@wpc.gov.lk | Tel: 2693970<br>Fax:2676280<br>dsplanning@wpc.gov.lk | Tel: 2693968<br>Fax:2689900<br>dsengca@wpc.gov.lk | Tel: 2689011<br>Fax:2689011 |